





Copyright © e-thaksalawa.moe.gov.lk






Copyright © e-thaksalawa.moe.gov.lk




Copyright © e-thaksalawa.moe.gov.lk

1. අතීත මිනිසා ආහාරයට ගත්තේ මොනවා ද?
2. ඇඳුම් ලෙස භාවිතා කළේ මොනවා ද?
3. සතුන් මැරීමට භාවිතා කළ උපකරණ මොනවා ද?
4. මේ අය තම වාසස්ථාන ලෙස තෝරා ගත්තේ කුමන ස්ථාන ද?
5. මේ යුගයේ අය ලබා ගත් විශාලතම ජයග්‍රහණය කුමක් ද?
6. එය සොයා ගත්තේ කෙසේ ද?
7. ගින්දර සොයා ගැනීම නිසා, ඔවුන්ගේ ආහාර රටාවෙහි ඇති වූ වෙනස්කම කුමක් ද?
8. ආහාර රටාවට අමතරව, ඔවුන්ට ගින්දර ප්‍රයෝජනවත් වූයේ කුමන කාර්යයන් සඳහා ද?
9. මෙම යුගයේ මුලින් ම හීලෑ කරගත් සතා නම් කරන්න.
10. සතුන් මරා කනු වෙනුවට හීලෑකර ගැනීම කෙරෙහි අවධානය යොමු වූයේ ඇයි?
11. ඔවුන් තැනින් තැනට යාමට පෙළඹ වූ සාධකය කෙටියෙන් හඳුන්වන්න.
12. එම යුගය හැඳින්වූයේ කෙසේ ද?


Copyright © e-thaksalawa.moe.gov.lk

1. මුල් යුගයේදී සත්තු මරා,අමුවෙන්ම අහරට ගැනීම,ගස්වල ගෙඩි/කොළ/මුල් ආදියත් අහරට ගැනීම.
2. ගස්වල කොළ අතු, ගස්වල පට්ටා වලින් සැකසු දේ, සතුන්ගේ හම් වලින් සැකසූ ඇඳුම් භාවිතයට ගැනීම.
3. දඬු මුගුරු, සතුන්ගේ ඇටකටු හා මුවහත් කළ ගල් පතුරු වලින් සකස් කර ගත් ආයුධ
4. විශාල ගස්වල බෙණ හා ගල්ගුහා, ගස් රුප්පා ආදියයි.
5. ගින්දර සොයා ගැනීමයි.
6. ගල් පතුරු එකට ගැටීමෙන් ගිනි පුපුරු විසිවනු දැක ඒවායින් වියළි කොළරොඩු අවුළුවා ගෙන ගින්දර ලබා ගැනීම.
7. සතුන් මරා අමුවෙන් මස් කෑම වෙනුවට ,මස් පුළුස්සා ආහාරයට ගැනීම - එය පෙර තත්ත්වයට වඩා රසවත් බව තේරුම් ගැනීම.
8. සීත කාලයේ දී උණුසුම ලබා ගැනීමටත්, නපුරු සතුන්ගෙන් ආරක්ෂා වීමටත්, වඩා හොඳ ආයුධ මෙවලම් සකස් කර ගැනීමටත් ප්‍රයෝජනවත් වීම.
9. බල්ලා ය.
10. දඩයම් නොලද අවස්ථා බහුල වීම - සතුන් අඩු වීම - මේ නිසා සතුන් ඇති කර ඔවුන් මගින් ආහාර ලබා ගැනීම වඩා පහසු බව තේරුම් ගැනීම.
11. හීලෑ කරගත් සතුන්ට ( එළුවන් , ගවයින්, බැටළුවන් ආදිය ) අවශ්‍ය ආහාර සොයා සත්තු රංචුවක් රැගෙන අහර සොයමින් තැනින් තැනට යෑම.
12. සංචාරක එඬේර යුගය යනුවෙනි.


Copyright © e-thaksalawa.moe.gov.lk